# ලෝකය සංඥා හා ඩෙරීඩා

අයින්ස්ටයින් පඬිවරයාට චිත්ත පරීක්ෂණයක් මගින් පමණක් අළුත්ම ප්‍රවාදයක් නිර්මානයකිරීමට හැකිවීමෙන් පෙන්නුම්කරන්නේ ම ලෝකය යන්න සිතෙන් නිර්මානය කෙරෙන්නක් බව ය. මනසෙන් වෙන්වූ වෙනම ලෝකයක් තිබිණි නම් ඔහුට එසේ නව ප්‍රවාදයක් ගෙතීමට නොහැකිවනු ඇත. සොසුර් පඬිවරයා විශ්වාසකළ අන්දමට මෙන් නොව මනසෙන් ස්වයත්ත වූ සංඥා කුලකයක් නැත. ඊනියා බාහිර ලෝකයකින් එලෙස සංඥා නොලැබෙන බව අපි දැන් දනිමු. එයට හේතුව ශබ්දයක් කිසිම විටෙක මනසින් තොරව සංඥාවක් නො වීම ය. කලින් සඳහන්කර ඇති පරිදි ශබ්දයක් සංඥාවක් බවට පත්වන්නේ මනසක් ඇති සත්ත්වයකුට මිස ශබ්දය පටිගත කරගන්නා සංයුක්ත තැටියකට හෝ වෙනත් එවැනි උපකරණයකට හෝ නො වෙයි.

සිංහල මිනිසුන් හූ කියන විට ඇතිකෙරෙන ශබ්දය ඔවුන්ට යම්කිසි සංඥාවක් බවට පත්වන්නේ මනස ද එහි දී බලපාන බැවින් මිස වෙනත් කරුණක් නිසා නො වෙයි. සිංහල මිනිසකු නගන හූ හඬක් අසා සිටින ඉංගිරිසි ජාතිකයකුට ඇතිවන සංඥාව කුමක් ද? ඉංගිරිසි ජාතිකයාට බොහේ විට එය නිකම්ම හූ හඬක් බවට පත්වනු නොඅනුමාන ය. බාහිරව පවතින්නේ යැයි කියන ලෝකයකින් ලැබෙන්නේ යැයි කියන සංඥා පිළිබඳ ව සොසුර් පඬිවරයා කියන කතා බටහිර යථාර්ථවාදී දර්ශනවලින් ගලා එන්නක් මිස අනෙකක් නො වෙයි. සොසුර් පඬිවරයාට සංඥායකයට (signifier) හා සංඥායිතයට (signified) ඔබ්බෙන් ප්‍රඥප්තය (referent) යනුවෙන් සංස්කෘතීන්ගෙන් හා භාෂාවන්ගෙන් ස්වායත්ත වූ යථාර්ථයක් ඇත. උදාහරණයක් ලෙස ගතහොත් ඉංගිරිසි භාෂාවෙන් හා ප්‍රංශ භාෂාවෙන් අශ්වයා සඳහා ඇති වචනවලින් ඒ ඒ ජාතිකයන්ට වෙනස් සංස්කෘතික දැනුමක් ලැබෙන නමුදු ඒ වචන පිටුපස ප්‍රඥප්තයක් ඇත. ඒ ප්‍රඥප්තය භාෂාවෙන් හා සංස්කෘතියෙන් ස්වායත්ත වෙයි.

සොසුර්ගේ සංඥායකය හා සංඥායිතය පදනම්කරගනිමින් බටහිර නිමිත්ත ධර්මවාදය (semiotics) යනුවෙන් දැනුම් පද්ධතියක් ගොඩනැගී ඇත. මිනිසුන්ගෙන් ස්වායත්ත සංඥා හැරුණුවිට මෙහි ප්‍රධානම ගැටළුව නම් සංඥායකය හා සංඥායිතය පසුපස ඇති යථාර්ථයක් වූ ප්‍රඥප්තයක් තිබීම ය. සොසුර් පඬිවරයා පශ්චාත්නූතනවාදී කියන ගුරුකුලයකට අයත්වූවෙක් නො විය. ඔහු ව්‍යුහවාදියකු වී යැයි කිවහැකිය. පශ්චාත්නූතනවාදී ඩෙරීඩා පඬිවරයා සොසුර් විවේචනය කරන්නේ ඔහුගේ නිමිත්ත ධර්මවාදය ද ප්‍රතික්ෂෙප කරමිනි. එහෙත් එසේ ප්‍රතික්ෂෙප කරන ඩෙරීඩා පඬිවරයාට ද ඊනියා යථාරථයක් නොමැතිව බැරි බව පැහැදිලි ය. ඔහු පමණක් නොව ඊනියා පශ්චාත්නූතනවාදී මනෝවිශ්ලේෂකයා වූ ලකාන් පඬිවරයා ද යථාර්ථයෙහි ද හිරවෙයි. මොවුන්ට බාහිර ලෝකයක යථාර්ථවාදී පැවැත්ම, අවිඥානික මනසක යථාර්ථවාදී පැවැත්ම ආදිය නැතිව ම බැරි ය.

ඩෙරීඩා පඬිවරයා ලිවීම (writing) යනුවෙන් ඔහු විසින් හැඳින්වෙන ව්‍යුහයක් පිළිබඳ ව කතාකරයි. (මේ ලිවීම අප සාමාන්‍යයෙන් දන්නා ලිවීමෙන් වෙනස් ය. ඩෙරීඩීය ලිවීම කතාකිරීමෙහි දී ද තිබිය හැකි ය.) ඔහු අනෙක් ව්‍යුහ ඊනියා විසංයෝජනයකට (deconstruction) පත්කරන්නේ ලිවීම නම් ව්‍යුහය ආශ්‍රයෙන් ය. ඔහුගේ විසංයෝජනයෙහි සොසුර් විද්වතාගේ සංඥායකය හා සංඥායිතය මෙන්ම නිමිත්ත ධර්මවාදය ආදියද ප්‍රතික්ෂෙප කෙරෙන්නේ කිසිදු ව්‍යුහයක් නැතිව නො වෙයි. ඔහු අනෙක් ව්‍යුහ විසංයෝජනයකර ඔහු විසින් ලිවීම යනුවෙන් හැඳින්වෙන ව්‍යුහය අභිෂේක කරයි. ඔහුගේ ප්‍රධානම කෘතිය වූ ඔෆ් ග්‍රැමටොලොජි (Of Grammatology) හෙවත් ලිවීම පිළිබඳ විද්‍යාව යන්න මේ අභිෂේකය සඳහා ලියැවුණක් වෙයි. මෙරට සිටින ඊනියා පශ්චාත්නූතනවාදීන්ට මේ කරුණ නොතේරෙන බව පැහැදිලි ය. සුනාමියත් සමග වයි (Y) පාර්ශ්වය හා ඉසෙඩ් (Z) පාර්ශ්වය ලෙස දෙකඩ වී ඇති එක්ස් (X) කණ්ඩායමට හෝ ඩෙරීඩා වඩාත්ම හොඳින් අවබෝධකරගෙන ඇත්තේ තමා යැයි ලෝකයට, එනම් සිංහල පාඨකයනට (මොවුන් කුමක් කීවද ඒ අළුත් දෙයක් වන්නේ පශ්චාත්නූතනවාදය ගැන ඉංගිරිසියෙන් නොකියවන සිංහලෙන් පමණක් කියවන පාඨකයනට බව පැහැදිලි කරගත යුතු ය), ප්‍රකාශකරන හතරපස්දෙනාට විසංයෝජනය පිළිබඳ අවබෝධයක් ඇත් ද යන්න ප්‍රශ්නයක් වෙයි.

ඩෙරීඩා බෙදාගැනීමට දඟලන එක් අයකුට අනුව ඩෙරීඩා පඬිවරයා හා බුදුන් වහන්සේ කියන්නේ එකම දෙයක් ය. මේ තැනැත්තා බුදුන් වහන්සේ විසින් දේශනාකරනලද විසංඛාර ඩෙරීඩා පඬිවරයාගේ විසංයෝජනය ලෙස හඳුනාගනියි.

© Prof. Nalin De Silva

ඩෙරීඩා බෙදාගැනීමට දඟලන්නවුන් එක්කෝ හිටපු හෝ වර්තමාන මාක්ස්වාදියෝ වෙති. එසේත් නැත්නම් බුදුදහම කෙලෙසීමට බුදුදහම පැත්තෙන් කතාකරන අබෞද්ධයෝ වෙති. බුදුන් වහන්සේ ඩෙරීඩා පඬිවරයා හා සමග සසඳා උන්වහන්සේ ඩෙරීඩා පඬිවරයාගේ මට්ටමට ඇද දැමීමට උත්සාහකරන්නේ හිටපු කතෝලික පූජකවරයෙකි. විසංඛාර යනු විසංයෝජනය නො වෙයි. විසංයෝජනයෙහි දී ව්‍යූහ සියල්ල ප්‍රතික්ෂේප නො වෙයි. එහෙත් විසංඛාරය යන්නෙන් කියැවෙන්නේ සංස්කාර සියල්ල අත්හැරිය යුතු බව ය. සියළු සංකල්ප, විසංඛාරය සංකල්පයක් ලෙස ගතහොත් එය ද ඇතුළුව, අනිත්‍ය, දුක්ඛ අනාත්ම වෙයි. විසංඛාරයෙහි දී ඊනියා ලිවීමක් හෝ අවිඥානික මනසක් හෝ ඉතිරි නො වෙයි.

මේ සියල්ල කෙටියෙන් නමුත් සඳහන්කිරීමට අවශ්‍යවූයේ චිත්ත පරීක්ෂණවල අදාලත්වය ගැන කීමට ය. චිත්ත පරීක්ෂණ කිසිසේත්ම සාමාන්‍ය පරීක්ෂණාගාරයක දී කෙරෙන පරීක්ෂණයකින් සංකල්පීය වශයෙන් වෙනස් නො වෙයි. අප තේරුම්ගත යුත්තේ ඒ සෑම අවස්ථාවක දී ම අවසාන වශයෙන් ගත්කල කෙරෙන්නේ ලෝකය නිර්මානයකිරීමක් බව ය. නව දැනුම යනු නව ලෝකයක් මිස ඊනියා යථාර්ථවාදී ලෝකයක් පිළිබඳ නව දැනුමක් නො වෙයි. ඒ ඒ මිනිසාගේ හෝ සවිඥානික සත්ත්වයාගේ හෝ මනසින් තොර, මනසින් ස්වායත්ත වූ ලෝකයක් නැත. මනස ද මනසේම නිර්මානයක් වූ කල පවතින්නේ යැයි කියන අනෙක් දෑ ගැන කියනුම කවරේ ද?

අයින්ස්ටයින් පඬිවරයා තම චිත්ත පරීක්ෂණ ඔස්සේ නව ලෝකයක් නිර්මානය කෙළේ ය. එය නිව්ටන් විද්වතාගේ ලෝකයවත්, ගැලීලිය ලෝකයවත්, ඇරිස්ටෝටලීය ලෝකයවත් නො වෙයි. අයින්ස්ටයිනීය ලෝකයෙහි ගුරුත්වාකර්ෂණයක් නැත. ඇත්තේ අවකාශකාලයක් හා එහි වක්‍රතාව ය. එහෙත් මෙයින් කියැවෙන්නේ අවකාශකාලයක් හෝ වක්‍රතාවක් හෝ ඇති බව නො වෙයි. එසේ ඇතැයි ගැනීම ආත්මාවාදී වෙයි. අවකාශකාලය යන්න අයින්ස්ටයින් පඬිවරයාටත් වඩා ඔහුගේ ගණිත ගුරුවරයා වූ මින්කොව්ස්කි නම් විද්වතාගේ නිර්මානයක් වෙයි. රීමාන් වැනි ගණිතඥයන් විසින් නිර්මානයකර තිබූ වක්‍රතාව යන සංකල්පය යොදාගනිමින් අයින්ස්ටයින් විද්වතා ගුරුත්වයෙන් තොර ලෝකයක් නිර්මානය කෙළේ ය. එහෙත් එය ද තවත් නිර්මානයක් පමණක් බවත් යම් දිනක නිදැල්ලේ වැටෙන්නේ යැයි කියැවෙන වස්තු වෙනත්ම ආකාරයකට දකින තැනැත්තකු ඇතිවිය හැකි බව සිහි තබාගත යුතු ය.

නිදැල්ලේ වැටෙන වස්තු වෙනම ආකාරයකට දකින්නා යන්න භයානක ප්‍රකාශයක් වන්නේ එමගින් පාඨකයා නොමග යා හැකි බැවින් ය. මෙය භාෂාව හා සංකල්ප පිළිබඳ ව ඇති ප්‍රශ්නයක් වෙයි. නිදැල්ලේ වැටෙන වස්තු යනුවෙන් වස්තු විශේෂයක් මනසින් ස්වායත්ත ව පවතින බවත් ඒ වස්තු අයින්ස්ටයින් පඬිවරයා ද ඉන්පසුව බිහිවන වෙනත් පඬිවරුන් ද විසින් විවිධ ආකාරවලින් නිරීක්ෂණය කෙරෙන බවත් ඉහත සඳහන් ප්‍රකාශයෙන් ගම්‍යවිය හැකි ය. භාෂාවේ එවැනි ප්‍රයෝග පිළිබඳ අපි සැලකිලිමත් විය යුතු ය. මෙහි දී සිදුවන්නේ නිදැල්ලේ වැටෙන වස්තු වෙනත් ආකාරයකට දැකීමකට වඩා නිව්ටන් පඬිවරයා විසින් ගුරුත්වය යටතේ චලනය වන්නේ යැයි හඳුන්වනු ලැබූ වස්තුවල චලිතය වෙනත් ආකාරයකට දැකීමක් යැයි කිවහැකි ය. එහෙත් එසේ කීම පවා අවසාන වශයෙන් ගත්කල නිවැරදි නොවන්නේ එහි දී එවැනි වස්තු විශේෂයක පැවැත්ම උපකල්පනය කෙරෙන බැවින් ය. මෙයින් ගොඩ ආ හැකි මගක් නොමැත. එයට හේතුව භාෂාවේ ඇති නාමපදවලින් යම් යම් දෑ පවතින බව උපකල්පනයකිරීම ය. භාෂාවක් හෝ වචන හෝ නොමැතිව වුව ද සංකල්ප යොදාගැනීමේ දී අපට මේ ගැටළුවට මුහුණදීමට සිදුවෙයි.

අපි දැන් නැවත වරක් අයින්ස්ටයින් පඬිවරයා විසින් නිර්මානය කරනු ලැබූ ලෝකයට යමු. එහි ගුරුත්වාකර්ෂණය යනුවෙන් බලයක් නැත. එහි වස්තු වෙයි. අයින්ස්ටයින් පඬිවරයාට අනුව මනසින් ස්වායත්ත ව වස්තු පවතින බව අමතක නොකළ යුතු ය. මේ වස්තු විසින් අවකාශ කාලය නිර්මානය කෙරෙයි. එලෙස නිර්මානය කෙරෙන අවකාශ කාලයට වක්‍රතාවක් වෙයි. වස්තු විසින් අවකාශ කාලය නිර්මානය කෙරෙනවා පමණක් නො වෙයි. වස්තු චලනය වන්නේ අවකාශ කාලයේ වක්‍රතාව මගින් තීරණය කෙරෙන පථවල ය. වෙනත් බාහිර බලයක් ක්‍රියාත්මක නොවන්නේ නම් වස්තුව (අංශුව) අවකාශ කාලයෙහි භූමිතිකයක් (geodesic) යනුවෙන් හඳුන්වනු ලබන වක්‍රයක් දිගේ චලනය වෙයි. ගුරුත්වාකර්ෂණය බලයක් නොවන බැවින් ඊනියා නිදැල්ලේ වැටෙන වස්තු ද චලනය වනුයේ භූමිතික දිගේ ය.

© Prof. Nalin De Silva

වස්තු විසින් නිර්මිත ලෝකයක් යන්න අළුත් සංකල්පයකි. නිව්ටෝනීය භෞතිකයෙහි අවකාශය හා කාලය වෙන වෙන ම පවතින අතර, වස්තු ඒ අවකාශයෙහි හා කාලයෙහි චලනය වෙයි. නිව්ටෝනීය ලෝකයෙහි වස්තු කිසිවක් නැතත් අවකාශය හා කාලය පවතියි. ඊනියා නිරපේක්ෂ අවකාශයක් යන්න පසුකලෙක නිව්ටෝනීය භෞතික විද්‍යාවට එකතු වූයේ ඒ හේතුවෙන් ය. අර්නස්ට් මාක් නම් පඬිවරයා ඉතා ප්‍රබල ප්‍රහාරයක් මේ සංකල්පයට එල්ලකළ බව අපි දුටුවෙමු. ඔහු කියා සිටියේ එවැනි නිරපේක්ෂක අවකාශයක් නිරීක්ෂණය නොකළ හැකි බවත් එලෙස නිරීක්ෂණය නොකළ හැකි සංකල්ප ඇසුරෙන් භෞතික විද්‍යාවේ තේරුම්ගැනීම් නොකළ යුතු බවත් ය. මාක් පඬිවරයා මතුකළ තවත් ප්‍රශ්නයක් වූයේ වෙනත් වස්තු කිසිවක් නැතිව තනි අංශුවක් පමණක් විශ්වයෙහි පවතින අවස්ථාවක දී, ඒ වස්තුවට ස්කන්ධයක් තිබේ ද යන්න ය.

මේ ප්‍රශ්න තරුණ අයින්ස්ටයින්ගේ මනස ප්‍රබෝධමත්කළ බවත් ඔහු ඉන් ආභාසයක් ලැබූ බවත් කලින් සඳහන් වී ඇත. ගුරුත්වාකර්ෂණය අභෝසිකරමින් සාධාරණ සාපේක්ෂතාවාදය නිර්මානයකිරීමට අයින්ස්ටයින් පඬිවරයා මෙහෙයවනු ලැබුයේ එවැනි ප්‍රශ්න විසින් ය. එහෙත් සාධාරණ සාපේක්ෂතාවාදයෙහි අද පවත්නා ආකාරයෙන් නම් මාක් පඬිවරයා මතුකළ ප්‍රශ්නවලට ඔව් යන පිළිතුර නොලැබෙන බව පැහැදිලි ය. අයින්ස්ටයිනීය සමීකරන පද්ධතිය විසඳූකල වස්තු නොමැති වුව ද සාධාරණ සාපේක්ෂතාවාදයෙහි විසඳුම් ලැබෙයි. ඉන් කියැවෙන්නේ වස්තු නොමැති වුව ද අවකාශ කාල තිබෙන බව ය. එමෙන් ම තනි වස්තුවක හෝ තනි අංශුවක හෝ ස්කන්ධයක් ඇත් ද යන ප්‍රශ්නයට තවමත් නිශ්චිත පිළිතුරක් නැත. අයින්ස්ටයින් පඬිවරයාට තරුණ කාලයෙහි දී මාක් විද්වතාගේ අදහස් බලපෑව ද වැඩිකල් නොගොස් ම ඔහු ඒ අදහස්වලින් ඉවත්විය. ඒ කෙසේ වුවත් මාක් පඬිවරයාගේ අදහස් සාධාරණ සාපේක්ෂතාවාදය නිර්මානයකිරීමේ දී ඔහුට බලපෑවේ ය.  එසේ වුව ද ඒ අදහස් සාධාරණ සාපේක්ෂතාවාදය විසින් තහවුරු කරනු ලැබීමක්  සිදු වී නැතැයි නිගමනය කිරීමට අපට සිදුවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva